# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

2016 දෙසැම්බර් මස 16 වන දින

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 12**

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලෙහි සාමාජිකත්වය**

විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයන් සඳහා වන විශ්‍රාම වැටුප් අරමුදල සම්බන්ධ ව 1999 ජූනි මස 10 වන දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

1999 ජූනි මස 10 වන දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 හි 4.1 ඡේදය ප්‍රකාර ව, විශ්‍රාම ගැන්වීමේ වයස දක්වා අවුරුදු විස්සක් හෝ වැඩි කාලයක් සේවය කළ හැකි වන සේවකයන් මාසික විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලබන අතර අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස දක්වා අවුරුදු විස්සක් හෝ වැඩි කාලයක් සේවය කළ නොහැකි වන සේවකයන් මාසික විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් නොලබනු ඇත.

ඒ අනුව, දැනටමත් විශ්‍රාම වැටුප් අරමුදලට බැඳී ඇති හා අවුරුදු විස්සක් හෝ වැඩි කාලයක් සේවය කළ නොහැකි වන සේවකයන්ට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත, විශ්‍රාම වැටුප් අරමුදලෙහි ශේෂය අර්ථසාධක අරමුදලට මාරු කිරීම සඳහා ඉඩ ලබා දීමට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2006 පෙබරවාරි මස 20 වන දින පැවැති 704 වන සභා වාරයේ දී තීරණය කරන ලදී.

ඉහත තීරණය හා සමගාමී ව උසස් අධ්‍යාපන ආයතන වෙත 2016 දෙසැම්බර් 15 වන දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා පහත කරුණු දැනුම් දීමට 2016 දෙසැම්බර් මස 15 වන දින පැවැති 955 වන සභා වාරයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

(අ) පළමු ස්ථිර පත්වීමේ දින සිට අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස (අධ්‍යයන -අවුරුදු 65; අනධ්‍යයන - අවුරුදු 60) දක්වා විශ්වවිද්‍යාල පද්ධතියේ වසර විස්සක් හෝ ඊට වැඩි කාලයක් සේවය කිරීමට නොහැකි වන විශ්‍රාම වැටුප් අරමුදලෙහි සාමාජිකයන්, ඔවුන්ගේ ඉල්ලීම මත විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලෙහි තම ශේෂය විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට මාරු කිරීමට හිමිකම් ලබනු ඇත. ඒ අනුව, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ශේෂය මාරු කිරීමට කැමැත්තක් දක්වන සාමාජිකයන් මෙම චක්‍රලේඛයෙහි **ඇමුණුම-I** හි දක්වා ඇති පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) පත්වීම් දිනයේ සිට අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස (අධ්‍යයන -අවුරුදු 65; අනධ්‍යයන - අවුරුදු 60) දක්වා විශ්වවිද්‍යාල පද්ධතියේ වසර විස්සක් හෝ ඊට වැඩි කාලයක් සේවය කිරීමට නොහැකි වන අලුතින් බඳවාගන්නා සේවකයන්ට ඔවුන්ගේ පත්වීම් ලිපියෙහි විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල / විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සම්බන්ධ ව දැනට පවතින වගන්තිවලට අමතර ව පහත වගන්තිය ඇතුළත් කිරීමෙන් මේ පිළිබඳ ව දැනුවත් කළ යුතුය.

නව වගන්තිය

"පත්වීම් දිනයේ සිට අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස (අධ්‍යයන -අවුරුදු 65; අනධ්‍යයන - අවුරුදු 60) දක්වා විශ්වවිද්‍යාල පද්ධතියේ වසර විස්සක් හෝ ඊට වැඩි කාලයක් සේවය කිරීමට නොහැකි වන සේවකයන් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය නොදැක්විය යුතු අතර එවැනි සේවකයෙකු විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලෙහි සාමාජිකයෙකු නොවනු ඇත".

(ඇ) විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලෙහි සාමාජිකයෙකු වන සහ ඉල්ලා අස්වීම/ සේවය අවසන් කිරීම / තනතුර අතහැර යාම/ මරණයට පත් වීම/ වැටුප් රහිත නිවාඩු හෝ අවම සේවා කාලයට බලපාන වෙනත් ඕනෑම හේතුවක් නිසා විශ්වවිද්‍යාල පද්ධතියේ වසර විස්සක් හෝ වැඩි කාලයක් සේවය කිරීමට නොහැකි වන සේවකයකු මාසික විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් නොලබනු ඇත. විශ්‍රාම වැටුප් අරමුදලෙහි ඔවුන්ට හිමි ශේෂය 1999 ජූනි 10 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 ප්‍රකාරව ආපසු ගෙවනු ඇත.

මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2016 දෙසැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක වනු ඇත.

කරුණාකර මෙහි අන්තර්ගත කරුණු අදාළ සේවකයන්ගේ අවධානයට ලක් කොට ඒ අනුව කටයුතු කළ යුතුය.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**
**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් /සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන/මණ්ඩපවල ජ්‍යෙෂ්ඨ සහකාරලේඛකාධිකාරිවරුන්/සහකාර ලේඛකාධිකාරිවරුන්
12. උසස් අධ්‍යාපන ආයතන/මණ්ඩපවල ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්/ සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවලජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති